# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.27 පැය 0945 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 852/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අධිකරණ නියෝගයක් දැනුම් දීම.**

2025.04.27 වන අද දින විරෝධතාකරුවන් පිරිසක් බොරැල්ල පොලිස් වසමේදී, සමසෞඛ්‍ය උපාධිධාරීන් බඳවා ගැනීමට අදාලව පවත්වනු ලබන තරඟ විභාගයට විරෝධතාවක් පැවැත්වීමට හා එම විභාග මධ්‍යස්ථාන වල ආරක්ෂාවට තර්ජනයක් වන පරිදි කඩාකප්පල්කාරී ක්‍රියාවන් සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇති බවට බොරැල්ල පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව අළුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව අළුත්කඩේ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සඳහන් වග උත්තරකරුවන් වන,

1. මධුෂාන් චන්ද්‍රජිත්, අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු (අංක 2/1 තෝරකොළයාය, මුල්ආඩියාවල, ඇඹිලිපිටිය)

2. එම්.එන්.එම්. නුස්රි, සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරී එකමුතුව සම කැඳවුම්කරු (ගෙලිඔය, ගම්පොල)

3. නදුන් දශරීත හේවාපතිරණ, සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරී එකමුතුව ලේකම් (ඉසද නවම් මාවත, දකුණු මාතර, මාතර)

4. රවී කුමුදේශ්, පරිපූරක වෛද්‍යසේවා වෘත්තීය සමිති ඒකාබද්ධ බලමණ්ඩලයේ සභාපති (881/01/01, මරදාන පාර, කොළඹ 10)

සහ ඔවුන්ගේ නියෝජිතයන් වෙත 2025.04.27 වන දින උදෑසන කාලයේ බොරැල්ල පොලිස් වසමේ බොරැල්ල කාන්තා කාසල් රෝහල ඉදිරිපිට හෝ ඒ අවට ප්‍රදේශවල පෙළපාලියක් ගමන් කිරීම, රාජ්‍ය ආයතන වලට ඇතුළු වීම, මාගර් වලට ඇතුල් වී මහා මාගර්යේ ගමන්ගන්නා වාහන වලට විශේෂිත ගිලන් රථවලට හා වෙනත් තැනැත්තන්ට මාගර්යන් භාවිතා කරන තැනැත්තන්ට පීඩාවක් ඇතිවිය හැකි බවත්, මෙවැනි උද්ඝෝෂණයක් පැවැත්වීම තුලින් මහජන සාමය කඩවීමේ දැඩි අවධානමක් ඇති බවත් ප්‍රචණ්ඩකාරි පිළිවෙත් අනුගමනය කළහොත් මෙම ස්ථානයේ බරපතල තත්වයක් ඇති විය හැකි බවටත් සෑහීමකට පත්වන බැවින් එකී තොරතුරු වාතර්ාවේ සඳහන් මාගර්ය තුල එකී මාගර්ය භාවිතා කරන්නන්ට පීඩා සිදුවන ලෙසට උද්ඝෝෂණ කටයුතු සිදුකිරීම වළක්වමින් ආඥාවක් නිකුත් කර ඇත.
මෙම ආඥාව කඩ කිරීම ගරු අධිකරණය මඟින් දඩුවම් ලැබිය හැකි වරදක් වනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**